# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2252/42 – 2021 නොවැම්බර් මස 05 වැනි සිකුරාදා – 2021.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට වකමුල්ල ජල සම්පාදන ක්‍රමය යටතේ ජල පිරිපහදු මධ්‍යස්ථානය පුළුල් කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/04/HB/282.
2021 ඔක්තෝබර් මස 27 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
අංක 35, ''ලක්දිය මැදුර'',
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 216, වකමුල්ල ග්‍රාම නිලධාරි වසමේ වකමුල්ල නමැති ගමේ පිහිටි වකමුල්ල සියඹලාගහ කොරටුව සහ පිංවත්ත නොහොත් පිංකැල්ල නමැති ඉඩමෙන් අක්. 01 රූඩ් 01 යි, පර්චස් 31.84 ක ප්‍රමාණයෙන් යුත් පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:

*උතුරට* : පැරණි ජල පවිත්‍රාගාර ඉඩම;
*නැගෙනහිරට* : කේ. ජී. කරුණාසේන මහතා හිමිකම් කියන ඉඩම;
*දකුණට* : ගම්සභා පාර;
*බටහිරට* : රසික මහතා හිමිකම් කියන ඉඩම.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :*

ගරු විහාරාධිපති,
පූජ්‍ය වකමුල්ලේ උදිත හිමි,
නයිගල රජමහා විහාරය,
වීරකැටිය.

11 – 412

---

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, ඇල්ලේකඩේ මංසන්ධියේ සම්ප්‍රේෂණ නළ හා බෙදාහැරීමේ නළ එළීම සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/01/KY/287.
2021 නොවැම්බර් මස 03 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
''ලක්දිය මැඳුර'',
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 591, විලානපල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇල්ලේකඩේ විලානගම ගමේ පිහිටි, ''ගොඩලියද්ද කුඹුර කොටසක්'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 03 ක් පමණ වන ඉඩම් කොටස:

*උතුරට* : වසුර්දීන් හිමිකම් කියන ඉඩම සහ අලවතුගොඩ අංකුඹුර මාර්ගය (මා.සං.අ.);
*නැගෙනහිරට* : වසුර්දීන් හිමිකම් කියන ඉඩම සහ ඇල්ලේකඩේ සිට අලකොලමඩ දක්වා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගය;
*දකුණට* : ඇල්ලේකඩේ අලකොලමඩ ප්‍රාදේශීය සභා මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස;
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :*

1. කේ. ජී. ඩී. නිල්මිණි මහත්මිය,
අංක 93/බී/2,
ඇල්ලේකඩේ, විලානගම.

11 – 413

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, ගම්පොල ජයමාලපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල පවිත්‍රාගාරය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය: DVP/02/01/KY/288.
2021 නොවැම්බර් මස 03 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
''ලක්දිය මැදුර'',
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1077, ගම්පොලවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගම්පොලවෙල ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඩී. එච්. රඹුක්වැල්ල මහතා විසින් මැන සකස් කරන ලද අංක 1485 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අක්ෂර "A" වශයෙන් දැක්වෙන ''මරියාවත්ත එස්ටේට් හෙවත් මහවැලි ගාඩ්න්'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි අක්කර 01 රූඩ් 02 පර්චස් 19.68 ක් පමණ වන ඉඩම් කොටස:

**මායිම්:**

*උතුරට* : පිඹුරු අංක 1050 හි කැබලි අංක 211, 463 හා කැබලි අංක 182;
*නැගෙනහිරට* : රජ ඇළ;
*දකුණට* : රජ ඇළ සහ ප්‍රාදේශීය සභා මාර්ගය;
*බටහිරට* : ප්‍රාදේශීය සභා මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන අයගේ නම සහ ලිපිනය :*

අධ්‍යක්ෂ,
ප්‍රොස්පෙරටි ලොජිස්ටික්ස් සහ ඉන්වෙස්මන්ට් පුද්ගලික සමාගම,
අංක 3/2, නාවලපිටිය පාර,
ගම්පොල.

11 – 414

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.